ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව
6 වන මට්ටම
**LLU6813** නීති විද්‍යාව
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II - 2022/2023
කාලය - පැය 1

---

දිනය : 2023 දෙසැම්බර් 02 — වේලාව: ප.ව. 01.30 - ප.ව. 02.30

---

පහත ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.
ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.
අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. "අධ්‍යාත්මික පාරිශුද්ධිය" වූ කලී සෙරන්ඩිබ් රාජ්‍යයේ කීර් කඳු මුදුනෙහි පිහිටා තිබෙන සිද්ධස්ථානයකි. මෙම ආගමික ස්ථානය මණ්ඩලයක් මඟින් කළමනාකරණය කරනු ලබන අතර, භක්තිකයින් විසින් පිළිපැදිය යුතු සම්ප්‍රදායන් හා පරිචයන් තීරණය කිරීමට ප්‍රධාන පූජකවරයාට බලය පවරා ඇත. අවුරුදු 10 සිට 50 දක්වා වයස් සීමාවන්හි පසුවන කාන්තාවන්ට සිද්ධස්ථානයට ප්‍රවේශ වීම වැළක්වීම ඇතුළු සියලු අත්‍යාවශ්‍ය ආගමික පරිචයන්හි අඛණ්ඩ පැවැත්ම මණ්ඩලය මඟින් තහවුරු කෙරේ. අධ්‍යාත්මික පාරිශුද්ධ සිද්ධස්ථානයේ භක්තිකයින් විසින් මෙම සීමා කිරීම වසර ගණනාවක සිට අනුගමනය කරනු ලබන අත්‍යාවශ්‍ය ආගමික පරිචයක් ලෙස විශ්වාස කරනු ලබන අතර, ඒවාහි ඕනෑම උල්ලංඝනය කිරීමක් භක්තිකයින්ගේ අධ්‍යාත්මික සංවර්ධනයට මෙන්ම සිද්ධස්ථානයේ පාරිශුද්ධියට ද බාධා කරනු ලබන බව විශ්වාස කරයි.

මෙම පරිචය මත පදනම්ව, 2023 දී සෙරන්ඩිබ් පාර්ලිමේන්තුව විසින් අවුරුදු 10 සිට 50 දක්වා වයස්වල පසුවන කාන්තාවන් සිද්ධස්ථාන පරිශ්‍රයට ප්‍රවේශ වීම වළක්වාලන අධ්‍යාත්මික පාරිශුද්ධ සිද්ධස්ථානය ( ප්‍රවේශ වීමට අවසර දීම සඳහා වූ) කෙටුම්පත යෝජනා කරන ලදී. එහි පූර්විකාවට අනුව, අධ්‍යාත්මික පාරිශුද්ධ සිද්ධස්ථානයට අනුබද්ධිත සියවස් ගණනාවක් පැරණි අත්‍යාවශ්‍ය ආගමික පරිචයන් පිළිගැනීම සඳහා මෙම නීතිය පනවා ඇත.

සෙරන්ඩිබ් හි තරුණ නීතිඥ සංගමය විසින් කාන්තාවන් කිසිදු සීමාවකින් තොරව අධ්‍යාත්මික පාරිශුද්ධ සිද්ධස්ථානයට පිවිසීමට අවසර ලබා දෙන නියෝගයක් අපේක්ෂාවෙන් මෙම කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයේ දී අභියෝගයකට ලක් කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති ලිංගිකත්වය මත පදනම්ව කිසිදු ආකාරයේ වෙනස් කොට සැලකීමක් වළක්වාලන මූලික අයිතිවාසිකම මෙම කෙටුම්පත මඟින් උල්ලංඝනය කරනු ලබන බවට ඔවුන් තර්ක කරන ලදී. **'Freedom'** නම් වූ කාන්තාවන් සවිබල ගැන්වීමේ කණ්ඩායමක් තර්ක කරන ලද්දේ මෙම කෙටුම්පත මඟින් ඇති කරනු ලබන වෙනස් කොට සැලකීම කාන්තා බැතිමතුන්ගේ අයිතීන් උල්ලංඝනය කිරීමක් වන බවයි.

ප්‍රධාන වශයෙන්, ගැටෙන අයිතිවාසිකම් තුලනය කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ලබන සමාජ විද්‍යාත්මක නීති ගුරුකුලයේ දාර්ශනික මතවාද ඇසුරින් උක්ත සිදුවීම විශ්ලේෂණය කරන්න.

---හිමිකම් ඇවිරිණි---